# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2270/62 - 2022 මාර්තු මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2022.03.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත ( 460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* :- 3/2/1/140.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* :- 4-3/8/2018/PC/468.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 107 ගණිහිමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගණිහිමුල්ල ගමේ පිහිටි සර්වේ ජනරාල් වෙනුවට ගම්පහ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සකස් කරන ලද 2021.12.28 දිනැති මූලික පිඹුරු අංක ගම් 4278 හි කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1624 වූ පහත සඳහන් ඉඩම් කොටස:

**කැබලි අංක 01**

ඉඩමේ නම: පරගහවත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 20-40 පමණ වයසැති පොල් ගස් 16 ක් ඇත; හිමිකම් පාන්නා: දෙවලපොල, වටිනාපහවත්ත පදිංචි එස්. පී. ඒ. අරුණසිරි සමරකෝන්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1624.

ඉහත සඳහන් ඉඩම/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 අප්‍රේල් මස 27 වැනි දින පූ.හා. 10.00 ට මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022.04.20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**යූ. ඩබ්ලිව්. ටී. යූ. රාජකරුණා,**
ප්‍රාදේශීය ලේකම්,
මීනුවන්ගොඩ.

2022 මාර්තු මස 03 වැනි දින,
මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03-0837


1A - G 36331 - 22 (2022/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*සැ.යු.- මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*